# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2414/09 - 2024 දෙසැම්බර් මස 10 වැනි අඟහරුවාදා - 2024.12.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : MUL/LND/02/ACQ/97(II).
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/8/2018/PC/418.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 275/C, ගල්ඇටුඹ ග්‍රාම නිලධාරි වසමට අයත් ගල්ඇටුඹ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද 2024.11.18 දිනැති හා අංක ක.සි. 820415 දරන පිඹුරෙහි කළාප අංක 04, පත්‍ර අංක 01 හි කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.6187 ක් වූ පහත සඳහන් ඉඩම.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම : කම්මල්ගොඩවත්ත හේන්යාය, කලුගලබැද්ද සහ කළුගහහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 20-25 අතර වයසැති කරුඳු වගාවක්, අවුරුදු 15-20 අතර වයසැති තේ සහ කුරුඳු වගාවක්, අවුරුදු 10-20 අතර වයසැති ඇට්ටෝනියා ගස් 60ක්, අඹ ගස් 2ක්, මැහෝගනි ගස් 02, පොල් ගස් 05ක්, අවුරුදු 20-30 අතර වයසැති අඹ ගස් 02ක් කොස් ගස් 02ක්, වල් කොහොඹ ගස් 30ක් සහ අවුරුදු 30-40 අතර වයසැති කොස් ගස් 02ක්; මුල් හිමිකම් කියන්නා : අබේසිරිනාරායන වනිගරත්න නන්දසිරි සහ තවත් අය; ප්‍රමාණය : හෙක්ටයාර් 1.6187.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2025 පෙබරවාරි මස 24 වැනි දින පෙ.ව. 10.00** ට මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2025 පෙබරවාරි මස 14** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2024 දෙසැම්බර් මස 04 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0085




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශුද්ධි පත්‍රයයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : DSWE/LND/2/F1/47.

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත් කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ 2024.07.29 වැනි දින අංක 2395/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* III වන කොටසේ පළ කරන ලද මාගේ යොමු අංක DSWE/LND/2/F1/47 සහ 2024.03.06 දිනැති දැන්වීමේ සඳහන් පරීක්ෂණ දිනය සහ වේලාව ද, වන්දි ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු දිනය ද, පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

| | |
|---|---|
| 9 වන වගන්ති පරීක්ෂණ දිනය සහ වේලාව | - 2025 පෙබරවාරි මස 17 පෙ.ව. 10.00 ට |
| වන්දි ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු දිනය | - 2025 පෙබරවාරි මස 10 |

අයි. ආර්. කේ. විතාරණ,
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2024 දෙසැම්බර් මස 05 වැනි දින,
වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0086

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.